# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි: 04/2019

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.
2019.07.29

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්‍ෂවරුන්

## ආයෝජන සහ ආයෝජන ලේඛනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2019.06.20 දින පැවති සිය 1012 වැනි සභා වාරයේ දී, විගණන කමිටුවේ නිර්දේශය සලකා බැලීමෙන් අනතුරුව, උසස් අධ්‍යාපන ආයතන/ ආයතන විසින් ඔවුන්ගේ ඉදිරි කාලවලදී වියදම් කිරීමට නියමිත අතිරික්ත මුදල් ස්ථාවර/ඇමතුම් තැන්පතු (Fixed/ Call Deposits) සහ රාත්‍රී කාලීන මිලදී ගැනීමේ ගිවිසුම් (Overnight Repurchase Agreements) වල කර ඇති ආයෝජනයන්හී ලේඛන හා ගිණුම්කරණ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාපටිපාටිය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වහාම ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

I. සියළුම ආයෝජන සිදු කළ යුත්තේ මූල්‍ය කමිටුවේ නිර්දේශය හා අනුමැතිය ඇතිව සහ 1971 අංක 38 මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003.06.02 දිනැති PED 12 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය ප්‍රකාරව ය.

II. කල් නොපිරුණු මුදල් ආපසු ගැනීම සඳහා අවසර ලබා දී ඇත්තේ එම මුදල් කල් පිරීමට පෙර ලබා ගැනීමට අවශ්‍ය වන්නේ ඇයි ද යන්න පිළිබඳව මූල්‍ය කමිටුව වෙත කරන නිර්දේශයන් මත පමණි.

III. සියලුම ආයෝජන, ආයෝජන ලේඛනයේ සටහන් කළ යුතුය (ආයෝජන ලේඛනය සඳහා ආකෘතිය ඇමුණුම -1 හි දක්වා ඇත).

IV. ආයෝජන අවසානයේ සමුච්චිත පොළිය, ආයෝජන ලේඛනයේ එම පේළියේ වෙනමම දැක්විය යුතුය.

V. කල් පිරීම සඳහා වන ඕනෑම ආයෝජනයක නැවත ආයෝජනය කිරීම, නව ආයෝජනයක් ලෙස සලකමින් සටහන් කර ගත යුතු අතර ආයෝජනයේ අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා නව ආයෝජන පිළිබඳ යොමු, කල් පිරුණු ආයෝජනයන්හී සටහන් යටතේ දැක්විය යුතුය.

VI. සියළුම ආයෝජන සහතික, නිලධාරීන් දෙදෙනෙකුගේ භාරකාරීත්වය යටතේ ද්විත්ව පාලක, ආරක්ෂිත ලොකරයක් තුළ බහා තැබිය යුතුය.

VII. ආයෝජන සහතිකවල සියලුම සංචලනයන් (Movement) සිදු කළ යුත්තේ ආරක්ෂක ලොකරය භාරව සිටින නිලධාරියෙකුගේ අනුමැතියෙනි.

VIII. උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විගණන අංශය විසින් ආයෝජනවල තහවුරු කිරීම්, වර්ෂය අවසානයේ දී හෝ ඔවුන් ආයෝජන සත්‍යාපනය කරන අවස්ථාවේ දී ලබාගෙන, උපකුලපති/ අධ්‍යක්ෂකවරයා හරහා මූල්‍ය කමිටුවට වාර්තා කළ යුතුය.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ.කළේ. මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත් :

1. ලේකම්/ නගර සැලසුම්,ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. ගණකාධිකාරී /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
10. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
11. විශ්වවිද්‍යාල / මණ්ඩප / ආයතනවල පුස්තකාලයාධිපතිවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් /සහකාර ලේඛකාධිකාරීවරුන්
13. මණ්ඩප /ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්/ සහකාර මූල්‍යාධිකාරීවරුන්
14. විශ්වවිද්‍යාලවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
15. විගණකාධිපති
16. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
17. වෘත්තීය සමිති ලේකම්වරුන්

ලිපි ගොනු අංක: යූජීසී/ සීඅයිඒ/ එෆ්/ අයිඒ චක්‍ර./1